# පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය.

**අභියාචනා අංක:- AAT/162/2024 (PSC)**

වයි.ජී.ආර්.පී.පෙරේරා

**අභියාචක**

**එදිරිව,**

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

**වගඋත්තරකරු**

**දිනය : 2025.10.23**

| | | |
|---|---|---|
| **ඉදිරියේ දී** | **විනිසුරු කේ.ටී.චිත්‍රසිරි** | **(සභාපති)** |
| | **ජේ.ජේ.රත්නසිරි** | **(සාමාජික)** |
| | **එස්.නන්දසේකරන්** | **(සාමාජික)** |

පෙනී සිටීම :- අභියාචක සිටී.
අභියාචක වෙනුවෙන් විශ්‍රාමික රජයේ සේවක කේ.එස්.එල්.පෙරේරා මහතා.
වගඋත්තරකාර රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙනුවෙන් සහකාර ලේකම් ගයාන් අරෝෂන මහතා.

**-නියෝගය-**

**විනිසුරු කේ.ටී. චිත්‍රසිරි මැතිතුමා**

අභියාචක වයි.ජී.ආර්.පී.පෙරේරා යන අය විසින් මෙම විනිශ්චය අධිකාරය වෙත 2024.09.27 දින ඉදිරිපත් කරන ලද අභියාචනා පෙත්සමෙන් ඉල්ලා ඇත්තේ, ඔහු වෙත නිකුත් කර ඇති සේවය හැර යාමේ නියෝගය අවලංගු කර ඔහු විසින් ඉල්ලා තිබූ නිවාඩු අනුමත කර දෙන ලෙස රාජ්‍ය සේවා කොමිෂන් සභාවට නියෝගයක් නිකුත් කරන ලෙසයි. ඉන් අනතුරුව, ඔහු විසින් 2025.03.18 දින ඉදිරිපත් කරන ලද ලිඛිත දේශනවල සඳහන් කර ඇත්තේ, රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්ගේ අත්සනින් යුක්තව, ඔහු වෙත එවන ලද 2023.03.30 දිනැති ලිපිය මඟින්, ඔහු විසින් කරන ලද නිවාඩු ඉල්ලීම ලබා දිය නොහැකි බව දන්වා එවා ඇති බවයි. ඉහත කී ලිඛිත දේශනයන්හි අවසාන ඡේදයේ සඳහන් කර ඇත්තේ, නැවත සේවයට එක්වී රට වෙනුවෙන් සේවය කිරීම ඔහුගේ දැඩි අභිප්‍රාය වන බවයි.

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් මෙම විනිශ්චය අධිකාරය වෙත ඉදිරිපත් කරන ලද 2024.12.13 දිනැති වාර්තාවේ, I වන ඡේදයේ සඳහන් කර ඇත්තේ, අභියාචක වෙත තනතුර අතහැර යාමේ නිවේදනයක් නිකුත් කර ඇති බවයි. එකී නිවේදනය ඉහත කී වාර්තාව සමඟ I වන ඇමුණුම වශයෙන් සළකුණු කර ඉදිරිපත් කර ඇත. ඉහත කී කරුණු වලින් පැහැදිළි වන්නේ, 2023.05.04 දිනැති ලිපියේ සඳහන් වන අභියාචකගේ සේවය අතහැර යාම ඉවත ලා ඔහුව නැවත සේවයේ පිහිටුවන ලෙස අභියාචක විසින් මෙම විනිශ්චය අධිකාරයෙන් ඉල්ලා ඇති බවයි.

සිය තනතුර අතහැර ගොස් සිටින රජයේ නිළධාරියකුගේ සේවය නැවත ලබා දීමේදී, සළකා බැලිය යුතු ප්‍රධාන කරුණු වන්නේ, තනතුර අතහැර යාම සඳහා උද්ගත වූ කරුණු මොනවාද යන්න පරීක්ෂා කර බලා සුදුසු තීරණයකට එළඹීම සහ ඇත්ත වශයෙන්ම එම තැනැත්තා සේවයෙන් බැහැර ගොස් ඇත්තේ නැවත සේවයට පැමිණීමේ අභිලාෂයෙන්ද යන්න තීරණය කිරීමයි.

ශ්‍රේෂ්ඨාධිකරණයේ පැවති "**ටයිටස් ජයන්ත** එදිරිව **ලංකා ගමනාගමන මණ්ඩලය** "(SC Appeal 133/2016) නඩුවේදී ශ්‍රේෂ්ඨාධිකරණය මෙසේ සඳහන් කර ඇත.

> **"An employee who fails to report to work without an acceptable excuse for a reasonable period of time would necessarily be a ground which justifies the employer to consider the employee as having vacated service."**

තවද "**ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව** එදිරිව **ජාතික සේවක සංගමය** " 1993(02) SLR-316 දරන නඩුවේදී ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ප්‍රකාශ කර ඇත්තේ, සේවය හැර ගිය තැනැත්තාගේ ක්‍රියාකාරකම් සහ නිවාඩු ලබා නොගෙන දීර්ඝ කාලයක් සේවයට නොපැමිණීම යන කරුණු සළකා බැලීමේදී එම නිළධාරියා කුමන චේතනාවකින් කටයුතු කර තිබේ දැයි තීරණය කළ හැකි බවයි.

ඒ අනුව මෙහිදී එම කරුණු කෙරෙහි අවධානය යොමු කරන ලදී. අභියාචකගේ ලිඛිත දේශනවල සඳහන් කර ඇත්තේ, ඔහුගේ අසනීප තත්ත්වයක් දන්වා 2023.01.03 සහ 2023.02.01 යන දිනයන්හීදී ඒ බව විදුලි

පණිවිඩ මඟින් දෙපාර්තමේන්තු ප්‍රධානියා දැනුවත් කළ බවයි. එය තහවුරු කිරීම සඳහා තැපැල් භාණ්ඩ කුවිතාන්සි 2ක් ඉදිරිපත් කර ඇතත්, ඔහු විසින් එවනු ලදැයි කියනු ලබන විදුලි පණිවිඩ යන්හි අන්තර්ගතය මොනවාද යන්න ඒ මඟින් තහවුරු වන්නේ නැත. එම විදුලි පණිවිඩ කුමන අය වෙත යොමු කර තිබේද යන්නවත් ඒ මඟින් තහවුරු වන්නේ නැත.

අභියාචක විසින් ඉදිරිපත් කර ඇති අභියාචනා පෙත්සමෙහි කිසිදු ස්ථානයක, ඔහු සේවයට වාර්තා නොකළ හේතුව පැහැදිලිව සඳහන් කර නැත. එම පෙත්සම මඟින් ඔහු හුවා දැක්වීමට අදහස් කරන්නේ ඔහු විසින් ඉල්ලා තිබූ නිවාඩු නිර්දේශ නොකිරීම යන කරුණයි.

අභියාචක විසින් 2024.10.01 දින ඉදිරිපත් කරන ලද අභියචනා පෙත්සමෙහි සඳහන් කර ඇත්තේ, ඔහු කෘෂිකාර්මික ඉඩමක් සංවර්ධනය කිරීම ආරම්භ කළ බවයි. ඒ අනුව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022 (II) දරන චක්‍රලේඛය අනුව දේශිය නිවාඩු ලබා ගැනීම සඳහා අයදුම් කළ බවද එකී දේශන වල සඳහන් වේ. එම දේශනවල කිසිදු ස්ථානයක අභියාචකගේ අසනීප තත්ත්වයක් හේතුවෙන් රාජකාරියට වාර්තා නොකළ බවක් සඳහන් වන්නේ නැත.

ඔහු විසින් ජනාධිපති ලේකම් කාර්යාලයට කරන ලද ඉල්ලීමකට අනුව, එම කාර්යාලයේ ඔම්බුඩ්ස්මන්වරයා විසින් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම් වෙත යවන ලද 2023.02.13 දිනැති ලිපියක අභියාචක කොළඹ විශ්ව විද්‍යාලයේ පරිගණක විද්‍යාවේදී උපාධිධාරීයකු වන හෙයින් එකී විෂය ක්ෂේත්‍රයට අදාළව පෞද්ගලික ආයතනයක සේවය කරමින් ඔහුගේ ප්‍රායෝගික දැනුම වර්ධනය කර ගැනීමට අපේක්ෂා කරන හෙයින් ඔහුට නිවාඩු ලබා දෙන ලෙසට කටයුතු කරන මෙන් ඉල්ලා ඇති බවත් සඳහන් වේ.

ඒ අනුව අභියාචක සේවයට වාර්තා කර නොමැති හේතූන් එක් එක් අවස්ථාවලදී එක් එක් ආකාරයට කරුණු ඉදිරිපත් කර ඇති බව පැහැදිලි වේ. වරෙක ඔහු අසනීප බවත්, තවත් වරෙක කෘෂි කාර්මික කටයුතු වල යෙදීම සඳහා නිවාඩු ඉල්ලා සිටි බවත්, තවත් අවස්ථාවකදී වෘත්තීය සුදුසුකම් වැඩි දියුණු කර ගැනීම සඳහා නිවාඩු ඉල්ලා සිටි බවටත් කරුණු ඉදිරිපත් වේ. එයින්ම පෙනී යන්නේ, අභියාචක යම් යම් හේතු දක්වමින් ඔහුගේ රැකියාව කුමන හෝ

අන්දමින් රැක ගැනීමේ උත්සාහයක නිරතව සිට ඇති බවයි. ඒ අනුව අභියාචක සේවයට වාර්තා කිරීම පැහැර හැර ඇති හේතූන් පැහැදිළිව ඉදිරිපත් නොවන නිසා, ඒ සම්බන්ධයෙන් සළකා බැලීමටවත් අවස්ථාවක් එළඹෙන්නේ නැත.

මෙම කරුණට අදාළව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කරන ලද 2024.12.13 දිනැති වාර්තාවෙහි සඳහන් කර ඇත්තේ, අභියාචක විවිධ සේවා ස්ථානවල සේවය කිරීමේදී ඔහුගේ දුර්වල පැමිණීම හේතුවෙන් තාවකාලිකව වැටුප් නතර කිරීම්, ප්‍රමාද වී සේවයට වාර්තා කිරීම් හා රාජකාරී මග හැරීම් සම්බන්ධයෙන් වන ලිපි රැසක් ඔහුගේ පෞද්ගලික ලිපි ගොනුවේ ඇතුළත්ව ඇති බවයි. එකී වාර්තාව සමඟ අමුණා ඇති එවකට අභියාචකගේ දෙපාර්තමේන්තු ප්‍රධානියාව සිටි අයගේ අත්සනින් යුක්තව රාජ්‍ය සේවා කොමිෂන් සභාවට ඉදිරිපත් කර ඇති වාර්තාවක සඳහන් වන්නේ, ඔහු 2012.01.02 දින රජයේ සේවයට පත් වීමක් ලැබීමෙන් පසු, සේවය අතහැර ගොස් ඇති 2023.01.17 දක්වා වූ අවුරුදු 10ක කාලය ඇතුළත සේවා ස්ථාන නවයක සේවයේ නියුතුව සිට ඇති බවයි. ඒ සමඟම අභියාචක දෙහිවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය තුළ සේවය කළ කාලසීමාව තුළ ඔහුගේ පැමිණීමේ දුර්වලතා සළකා බලා 2017 මැයි මස වැටුප් ගෙවීම තාවකාලිකව අත් හිටවා ඇති බවටද එම වාර්තාවේ සඳහන් වේ. එහි තව දුරටත් සඳහන් වන්නේ, අභියාචක මහජන නියෝජිතයින් සමඟ ගැටුම් ඇති කර ගැනීම හේතුවෙන්, අනුප්‍රාප්තිකයන් රහිතව වුවද එම ස්ථානයෙන් ස්ථාන මාරු කරන ලෙසට දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් ඉල්ලා ඇති බවයි.

රත්මලාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සේවය කරන කාලපරිච්ඡේදය තුළදීද, අප්‍රේල් මාසයට අදාළව අභියාචකගේ වැටුප් ගෙවීම තාවකාලිකව අත්හිටුවීම සඳහා පියවර ගන්නා ලෙස දැනුම් දී ඇත. කොවිඩ්-19 වසංගත රෝගී තත්ත්වය යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් අත්‍යාවශ්‍ය සේවා පවත්වාගෙන යන කාල සීමාව තුළ, මෙම නිළධාරියා සේවයට වාර්තා කිරීම පැහැරහැර ඇති බවටද එහි සඳහන් වේ. ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව තුළ සේවය කරන කාලපරිච්ඡේදය තුළද, 2022.01.18 සිට 2022.02.22 දක්වා විධිමත් නිවාඩු අනුමත කරවා ගැනීමකින් තොරව සේවයට වාර්තා කර නැති බවටද තව දුරටත් සඳහන් කර ඇත. රාජ්‍ය භාෂා

දෙපාර්තමේන්තුවේ සේවය කරන ලද කාලපරිච්ඡේදය තුළ  දින 66ක් සේවයට වාර්තා කිරීමෙන් වැළකී ඇති  බවටද එහි සඳහන් වේ. මෙම කරුණු ඉදිරිපත් කර ඇත්තේ, අභියාචකගේ පෞද්ගලික ලිපි ගොනුව පරීක්ෂා කිරීමෙන් අනතුරුවය. එබැවින් එම කරුණු වැරදි සහගත බවට තීරණය කළ නොහැක.

මෙහිදී සඳහන් කළ යුතු තවත් කරුණක් වන්නේ, අභියාචක විසින් ඔහුගේ සේවය අතහැර යාම නිකුත් කිරීමෙන් මාස හයක කාලපරිච්ඡේදයක් තුළ නැවත සේවය ලබාගැනිම සඳහා ඉල්ලීමක් කළ කර නොමැති බවයි. ආයතන සංග්‍රහයේ XLVIII වන පරිච්ඡේදයේ 37:1 වගන්තිය අනුව එවැනි ඉල්ලීමක් මාස හයක් තුල ඉදිරිපත් කළයුතු වුවත්, අභියාචක ඒ අනුව කටයුතු කර නොමැත. එබැවින් එවැනි තත්ත්වයක් යටතේ, අභියාචකට නැවත සේවය ලබා දීමට නියෝගයක් නිකුත් කළහොත්, ඒ මඟින් ආයතන සංග්‍රහයේ විධිවිධාන නොසළකා හැරියා වන්නට පුළුවන.

ඉහත හේතූන් සළකා බලා අභියාචක විසින් ඉදිරිපත් කර ඇති මෙම අභියාචනය නිෂ්ප්‍රභා කිරීමට තීරණය කරමු.

අභියාචනය නිෂ්ප්‍රභා කරමු.

විනිසුරු කේ.ටී.චිත්‍රසිරි
(සභාපති)

මම එකඟ වෙමි.

ජේ.ජේ.රත්නසිරි
(සාමාජික)

මම එකඟ වෙමි.

එස්.නන්දසේකරන්
(සාමාජික)

දෙව්මිනි/-